ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ළබැඳි

පුවත් හසුනකට වඩා වැඩි යමක්...

2018 ජූනි කලාපය



# ළමා ශ්‍රමිකත්වය පිටු දකිමු



## මොහොතක් සිතන්න...

ලොව පුරා දරුවන්ගෙන් මිලියන 215 ක් පමණ ළමා ශ්‍රමිකත්වයෙහි අඳුරු විපාක භුක්ති විඳිති. එක්සත් ජාතීන්ට අනුව ඔවුන්ගෙන් බොහෝ පිරිසකගේ ශ්‍රමය දවසෙහි වැඩි කාලයක් පුරා සූරා ගැනෙන්. මෙම දරුවන්ට පාසල් අධ්‍යාපනය ලැබීමට නොලැබෙන අතර බොහෝවිට සෙල්ලම් කර විනෝද වෙමින් ළමා ලෝකයෙහි සුන්දරත්වය භුක්ති විඳීමට ඇති අයිතියද අහිමි වී ඇත. ඔවුන්ගෙන් අඩකට වඩා වැඩි පිරිසක් නිරත කරවා ඇත්තේ අන්තරාදායක රැකියාවල වන අතර වහල් සේවය වැනි ශ්‍රමය බලහත්කාරයෙන් සූරා ගැනෙන අවස්ථාවන්ද වාර්තාවේ. එසේම මත් ද්‍රව්‍ය ජාවාරම්, ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම්වල පවා දරුවන් නිරත කරවා ගැනෙන අවස්ථාද ඇතිබව කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුව ඇත. මේ ඔබේත්,අපේත්,දරු කැළ මෙන්ම මුලුමහත් රටේ අනාගතයත් නොවේද..?

## හැඳින්වීම

දැයේ අනාගත උරුමකරුවන් දරුවන්ය. එකී ළමයා යහපත් පුරවැසියකු බවට පත්වන සෞභාග්‍යමත් සංහිඳියාවකින් යුතු ජාතියක් වශයෙන් නැගී සිටීමට, මූලිකවම දැයේ දරුවන් ආරක්ෂා කිරීම සිදු කල යුතුය. ඒ සඳහා ඔවුන් කායිකව හා මානසිකව සංවර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කළ යුතුය. එය විශ්ව ව්‍යාප්ත වගකීමකි. ඇතැම් දරුවන්ට එය අවහිර වී ඇති බව දිනපතා වාර්තා වන තොරතුරු වලින් අනාවරණය වේ. ජාත්‍යන්තර වශයෙන් ළමා ශ්‍රමිකත්වය පිළිබඳ තොරතුරු රැසක් වාර්තා වුවද දේශීය වශයෙන් එලෙස වාර්තා වන්නේ අවම වශයෙනි. කෙසේ නමුත් ළමුන් කුමන අයුරින් හෝ සේවයේ යෙදවීම ඔවුන් සතු අයිතිවාසිකම් අහිමි කිරීමක් බව කිව යුතුමය.

ළමා කාලය තුළ ඔවුන් වෙත ලැබිය යුතු මානසික හා ශාරීරික සෞඛ්‍යය, අධ්‍යාපනය පෝෂණය, සෙනෙහස ආදිය ලැබීම, සමාජයට අවශ්‍ය පරිදි හා සමාජය පිළිගන්නා අයුරින් ඔවුන්ගේ ගති සිරිත්, චර්යාවන් හා ආකල්ප සකසා ගැනීමට මනා රුකුලක් වේ. විශේෂයෙන් දරුවන් සේවයේ යෙදවීම සම්පූර්ණයෙන් නවතා දමා සියලු දරුවන්ට අනිවාර්යය අධ්‍යා-පනය ලබාදීම වැඩිහිටි අප සැමගේ පරම යුතුකම වේ.

## ළමා ශ්‍රමිකත්වය........



එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේද ළමා ශ්‍රමය පිළිබඳව සඳහන් වේ. ඒ "ආර්ථික වශයෙන් සූරා කෑමෙන් සහ අවදානම් වැඩ කිරීමෙන් ළමයා ආරක්ෂා කළ යුතු බවත්, ළමයාගේ සෞඛ්‍යයට හෝ ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සදාචාරත්මක හෝ සමාජ සංවර්ධනයට හානි කරවන යම් ක්‍රියාවකින් ආරක්ෂා කල යුතුය" යනුවෙනි. ළමයා විවිධාකාරයෙන් ශ්‍රමිකයකු බවට පත්විය හැකි අතර, වයස අවුරුදු 18 ට අඩු ළමයින් විවිධ ලෙස සේවයේ යෙදවීම, නිතිපතා හෝ සෑම දිනකම දීර්ඝ කාල වේලාවන්හි වැඩෙහි යෙදවීම, අධ්‍යාපනය සඳහා ඉඩ නොලැබීම හෝ අහිමිවීම යන සාධක මත එම තත්ත්වය තිවුර විය හැකිය. කෙසේ වෙතත් පුද්ගලයෙකුගේ පෞරුෂ වර්ධනයේ වැදගත්ම කාලය ළමා කාලය වන බැවින් ළමයා ශ්‍රමිකයෙකු වීමෙන් ආරක්ෂා කර ගැනීම අනිවාර්යය කරුණකි.

## ළමා ශ්‍රමය ක්‍රියාත්මක වන ආකාරය



ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමිකත්වය පිළිබඳ වාර්තාවීම් ඉහළ සංඛ්‍යාත්මක අගයක් නොගත්තද රට තුළ සමාජ ප්‍රශ්නයක් බවට පත් නොවීමට වග බලා ගත යුතුය. ශ්‍රී ලංකාව තුළ ළමුන් වැඩි වශයෙන් සේවයේ යොදවා ගනු ලබනුයේ ගෘහාශ්‍රිතව සහ ව්‍යාපාර ආශ්‍රිතවය. එමෙන්ම මෑත කාලයේදී මත්ද්‍රව්‍ය වැනි තහනම් භාණ්ඩ ප්‍රවාහනය සහ ගණිකා වෘත්තිය ආශ්‍රිතව ළමා ශ්‍රමිකත්වය පිළිබඳව වාර්තාවීම් දක්නට ඇත.

## ළමා ශ්‍රමිකත්වයේ භයානක තත්වය



.

මෙහි ඇති භයානක තත්වය වන්නේ ළමා ශ්‍රමිකත්වයට ගොදුරු වූවන් අමානුෂික ලෙස කෲරෙ වද හිංසාවන්ට ලක් වීම, ඔවුන්ගේ අධ්‍යාපන කඩාකප්පල් වීම, පෞරුෂ සංවර්ධනය අඩාල වීම, රෝගී වීම,විවිධ අපයෝජනයන්ට ගොදුරු වීම සහ වින්දිතයන් බවට පත් වීමෙන් සමාජයට වෛර කරන පුද්ගල කොට්ඨාසයක් බිහි වීමය. මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට කටයුතු කිරීම සැමගේ වගකීම හා යුතුකමද වේ.

## ළමුන් රැකියාවල නිරත කරවීම නීතියට අනුව වරදකි.



නීතියට අනුව කිසිදු අයුරකින් අවුරුදු 14 ට අඩු දරුවන් රැකියාවක යෙදවිය නොහැක. එලෙස යොදවන පුද්ගලයින්ට එරෙහිව අවුරුදු 5 ක සිර දඬුවම් ලබා දිය හැක. එමෙන්ම අවුරුදු 14 ත් 18 ත් අතර ළමයින් සමහර අවස්ථාවලදී සේවයේ යෙදවිය හැකි නමුත් ඔවුන්ගේ ජීවිතයට, සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සදාචාරයට මෙන්ම ශාරීරිකව හෝ මානසිකව හානිගෙන දෙන අනතුරුදායක රැකියාවල යෙදවීම තහනම්ය. (පළිබෝධනාශක, රසායන ද්‍රව්‍ය, ගිනිකෙළි, වාතේ උණුකිරීම්, පතල් කැනීම් ,ගල් කැඩීම්, ගස් නැගීම හා කැපීම, දර කැපීම, කැලිකසළ ප්‍රවාහනය, ආදි කටයුතු මෙන්ම ගිනි බෝල කරකැවීම, කරණම් ගැසීම ආදි කටයුතුවල ළමයින් යෙදවීම තහනම්ය). එලෙස අනතුරුදායක රැකියාවල ළමයින් යොදවන සේවායෝජකයින්ට එරෙහිව රු. 10,000/- දඩයක් , වසරක සිර දඬුවමක් හෝ එම දඬුවම් දෙකම සමඟ හිංසනයට පත් ළමයාට අධිකරණයේ අභිමතය පරිදි වන්දි මුදලක්ද නියම කල හැක.එමෙන්ම අවුරුදු 18 ට අඩු ළමයෙකු කිසිදු අයුරකින් රාත්‍රී කාලයේ සේවයේ යෙදවිය නොහැක.

# සභාපතිතුමියගෙන්,



දැයේ දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කළ යුතුය. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නිරන්තරයෙන්ම කැපවී සිටියි. ළමා ශ්‍රමිකත්වය යනු වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය තුල ප්‍රබලව දක්නට නොලැබෙන කාරණයක් වූවද, ඒ පිළිබඳව අප රටක් ලෙස අවධානය යොමු කල යුතුය. දිවයිනේ ඇතැම් ප්‍රදේශවල අඩුවැඩි වශයෙන් ළමා ශ්‍රමිකත්වය පිළිබඳ වාර්තා වීම් දක්නට ලැබෙන අතර අප සැවම එක්ව ඒ සඳහා ප්‍රතිකර්ම යෙදිය යුතුය. පාසල් යායුතු වයසේ පසුවන දරුවන් ශ්‍රමිකයන් ලෙස කටයුතු කිරීම සැබවින්ම ගැටලුවකි. කවර කරුණක් නිසා වුවද එසේ නොකළ යුතුය. දරුවන්ට, දරුවන්ගේ ලොව උරුම කර දිය යුතුමය. එසේ නොවුනහොත් ඔවුන් තුළින් බිහිවන වැඩිහිටියන් සමාජයට වෛර කරන පුද්ගල කොට්ඨාශයක් බවට පත් වේ. විශේෂයෙන් ළමා ශ්‍රමික්තවය රට තුළින් තුරන් කිරිම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පමණක් තනිව කල හැක්කක් නොවේ. ඒ සඳහා ඒකරාශිවීම කාලීන අවශ්‍යතාවයකි. දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබාදීම දෙමව්පියන් ඇතුලු භාරකරුවන් සියලු දෙනාගේම වගකීමකි. එමෙන්ම ළමා ශ්‍රමිකත්වය පිළිබඳ දැනගත් විගසම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය වන 1929 වෙත දැනුම් දෙන ලෙසද මම ඔබෙන් ඉල්ලා සිටිමි. එය සුරක්ෂිත දරුපරපුරක් රටට උරුම කරදීම සඳහා ඔබ විසින් සිදුකරන මහඟු සේවයකි

# නියෝජ්‍ය සභාපතිතුමියගෙන්



මුළුමහත් දේශයේම දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය වඩාත් තහවුරු කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කැපවී කටයුතු කරමින් සිටියි. විශේෂයෙන් ළමා ශ්‍රමිකත්වය තුරන් කිරීම සඳහා ද අධිකාරිය වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත. ළමා ශ්‍රමිකත්වය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම ඉන් එක් වැඩපිළිවලකි. එහිදී පාසල් නොයන දරුවන් පාසල් වෙත ඇතුළත් කිරිම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදීමද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සිදු කරයි. ළමා ශ්‍රමිකත්වය තුළින්, දරුවන් තුළ බිඳුනු පෞරුෂත්ව ලක්ෂණ ඇති වුවහොත් ඉන් දැඩි අනර්ථකාරී තත්වයක් සමාජයේ උද්ගත වේ. එය රටේ පැවැත්මටත්, සංවර්ධනයටත් දීර්ඝකාලීනව බලපාන්නාවූ සමාජ ප්‍රශ්නයකි. මෙම තත්වය තුරන් කිරීම සඳහා අප සියලු දෙනාම ඒකරාශි විය යුතුය. එලෙස ඒකරාශිවීම දරුවන්ගේ යහපත සඳහා ඔබෙන් අපට ලැබෙන මනා පිටුවහලක්ද වේ.



නූතන සංකීර්ණ සමාජ ප්‍රවාහය තුළ සුරක්ෂිත දරු පරපුරක් දැයට දායාද කිරීමේ භාරදූර කර්තව්‍යය සමාජයීය වශයෙන් ප්‍රබල අභියෝගයක්ව පවතියි. මෙම අභියෝගය ජය ගැනීමට සමස්ත සමාජයම ඒකාරාශිවීම අත්‍යවශ්‍ය වේ. ළමා වයසේදී වැඩිහිටි වගකීම් දැරීමට සිදුවීම බරපතල සමාජ අර්බුදයක් ගොඩ නැගීමක් ලෙස දැකිය හැක. දැයේ දරුවන්ට නිදහස්, නිවහල් සුන්දර සහ සුරක්ෂිත ළමා වියක් ගත කිරීමට අවැසි ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කරදීම වැඩිහිටි අප සැමගේ පරම යුතුකමකි. ඒ සඳහා ළමා ශ්‍රමිකත්වය තුරන් කිරීමට කටයුතු කළ යුතුය. සියලු දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා ඇති බාධක වලට පිළියම් යෙදිය යුතුය. එමෙන්ම අන්තර්ජාතික ප්‍රමිතීන්ට සරිලන පරිදි ළමා ශ්‍රමිකයන් හා අධ්‍යාපනය පිළිබඳ නීතිය ක්‍රියාත්මක කළ යුතුය. එමෙන්ම දිළිඳු බව තුරන්කර වැඩිහිටියන් සඳහා ශිෂ්ඨසම්පන්න රැකියා ඇති කළ යුතුය. විශේෂයෙන් ළමා ශ්‍රමිකයන් පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමද අත්‍යවශ්‍ය කරුණකි.

## අප සමගින් එක් වන්න


# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

අංක 330,
තලවතුගොඩ පාර,
මාදිවෙල,
ශ්‍රී ජයවර්ධනපුර.
දු. අං. - 0112778911-12-14
ෆැක්ස් - 0112778915
www.childprotection.gov.lk
ncpa@childprotection.gov.lk


ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
ChildLine Sri Lanka
1929